ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
**Department of Examinations, Sri Lanka**
NATIONAL EVALUATION AND TESTING SERVICE

පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை, பத்தரமுல்ல.
**Pelawatta, Battaramulla.**

දුරකථනය / தொலைபேசி / Telephone: 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206, 2787207

ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2785231

තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS: තැ.පෙ. 1503 කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O. Box 1503 Colombo

අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Web Address: www.doenets.lk / www.results.exams.gov.lk

E-mail: exams@doenets.lk

මගේ අංකය / எமது இல / My No.: DOE/9/3/5/GV/Re-scrutiny/2026

ඔබේ අංකය / உமது இல / Your No.: ..............................

දිනය / திகதி / Date: 2026.09.07

සියලුම විදුහල්පතිවරුන් වෙත,

**5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2026**
**අභියාචනා උත්තර පත්‍ර පරීක්ෂා කිරීම**

උක්ත විභාගයේ ප්‍රතිඵල 2026.09.02 දින නිකුත් කළ අතර, අභියාචනා උත්තර පත්‍ර පරීක්ෂා කිරීම සඳහා අයදුම්පත් කැඳවීම 2026.09.07 දින සිට 2026.09.21 දක්වා මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ සිදු කිරීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම මේ සමඟ ඇති උපදෙස් අනුව සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

1. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.doenets.lk වෙබ් අඩවියෙහි Exam Information Centre වෙත පිවිස හෝ https://onlineexams.gov.lk වෙත පිවිස පාසල වෙත ලබා දී ඇති පරිශීලක නාමය (User Name) හා මුර පදය (Password) භාවිත කරමින් School Login වෙත පිවිසෙන්න.
2. අභියාචනා උත්තර පත්‍ර පරීක්ෂාවට අදාළ වැඩසටහන වෙත පිවිස අභියාචනාවට අදාළ විභාග අංකය හා නම තිරයේ දිස්වන ලැයිස්තුවෙන් තෝරා Apply යනුවෙන් ඇති තැනට ඉදිරියෙන් ඇති කොටුව සලකුණු කරන්න. නිවැරදි ව සලකුණු කළ පසු එම කොටුව නිල් පාටින් දිස්වේ. තිරයේ දිස්වන නම හා ලබා ඇති ලකුණු නිවැරදි බවට පරීක්ෂා කර එය තහවුරු කරගන්න.
3. අභියාචනා කරන අනෙකුත් අපේක්ෂකයින් ද ඒ අයුරින්ම ඇතුළත් කිරීම සිදු කරන්න.
4. අභියාචනා අයදුම්කරන ලද සියලුම සිසුන්ගේ තොරතුරු ඇතුළත් සාරාංශ වාර්තාව බාගත (Download) කර ගන්න.
5. එහි දෘඪ පිටපත (Hard Copy) සමඟ එක් එක් සිසුවාට අදාළ පහත සඳහන් ලේඛන අමුණා **2026 සැප්තැම්බර් 21 දිනට පෙර** විදුහල්පති විසින් පහත ලිපිනයට යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

   - ❖ එක් එක් අයදුම්කරුවන්ගේ සාධනය පිළිබඳව වෙන වෙන ම සකස් කළ පන්ති භාර ගුරුවරයාගේ නිර්දේශය
   - ❖ එක් එක් අපේක්ෂකයා පෙන්වා ඇති විශේෂ දක්ෂතා හා කුසලතා වෙන වෙන ම සඳහන් කළ වාර්තාව

   විභාග කොමසාරිස් ජනරාල්
   පාසල් විභාග ඇගයීම් ශාඛාව
   ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
   තැ.පෙ. 1503, කොළඹ.

6. එවනු ලබන සෑම ලේඛනයක ම පිටපතක් විදුහල්පති භාරයේ තබා ගැනීම අනිවාර්යය වේ.
7. මාර්ගගත ක්‍රමයට පමණක් අයදුම්පත් භාර ගන්නා අතර, **2026.09.21 දිනෙන් පසු** කිසිදු හේතුවක් මත අභියාචනා උත්තර පත්‍ර පරීක්ෂාව සඳහා වන ඉල්ලීම් භාර නොගන්නා බව අවධාරණය කරමි.
8. අයදුම් කිරීමේ දී ඇතිවන තාක්ෂණික ගැටලු සම්බන්ධයෙන් 0113661122/0113671568 දුරකතන අංක ඔස්සේ මාර්ගගත ඒකකය සම්බන්ධ කරගන්න.

**ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ**
විභාග කොමසාරිස් ජනරාල්